# ටෙන්ඩර් කැඳවීම

ශ්‍රී ලංකා මහ බැංකුව

இலங்கை மத்திய வங்கி

CENTRAL BANK OF SRI LANKA

## ශ්‍රී ලංකා මහ බැංකුවේ භෝජනාගාර සහ ආහාර පාන සේවා සැපයීමේ ස්ථානයන් පවත්වා ගෙන යාම සඳහා ටෙන්ඩර් කැඳවීම

**ශ්‍රී ලංකා මහ බැංකුවේ භෝජනාගාර සහ ආහාර පාන සැපයීමේ සේවාදායකයාගේ ගිවිසුම 2022.07.22 දිනට කල්පිරෙන බැවින් 2022.07.25 දින සිට වසර 02ක කාලයක් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ භෝජනාගාර සහ ආහාර පාන සැපයීමේ සේවා ස්ථානයන් පවත්වාගෙන යාම සඳහා පළපුරුදු සැපයුම්කරුවන්ගෙන් ටෙන්ඩර් අයදුම්පත් කැඳවනු ලැබේ.**

1. 2022.03.31 දිනට භෝජනාගාර සහ ආහාර පාන සේවා සැපයීමේ නියැලී සිටින ලියාපදිංචි ආයතන හෝ පුද්ගලයින්හට මේ සඳහා ඉල්ලුම් කළ හැකිය.
2. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් ගිවිසුම් කාල සීමාව තුළ ඉහත සඳහන් සේවා සැපයීම වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කරනු ලබන වටිනාකමින් යුතු කාර්ය සාධන සුරක්ෂණයක් (Performance Guarantee) ලබාදිය යුතු අතර ලිඛිත ගිවිසුමකට එළඹිය යුතුය.
3. මෙම ටෙන්ඩරයට අදාළ නියමයන් සහ කොන්දේසි, ටෙන්ඩර් ලියකියවිලි සමඟ නිකුත් කෙරෙනු ඇත.
4. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන සැපයුම්කරුවන් හට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අපේක්ෂිත සේවාවන් පිළිබඳ නිශ්චිත කරුණු දැක්වීම සඳහා පූර්ව ටෙන්ඩර හමුවක් (Pre Bid Meeting) 2022.06.03 දින පෙ.ව 11:00 ට ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන කාර්යාලයේ බිම් මහලේ පැවැත්වෙන අතර ඒ සඳහා සහභාගී වීම අනිවාර්ය වේ.
5. 2022.05.31 දින සිට 2022.06.15 දින දක්වා සෑම කාර්යාලීය දිනකම පෙ.ව 10.00 සිට ප.ව 2.00 දක්වා ටෙන්ඩර් ලියකියවිලි ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්ය මණ්ඩල සේවා කළමණාකරණ දෙපාර්තමේන්තුවේ ආපසු නොගෙවනු ලබන රු. 1000/- ක ගාස්තුවක් ගෙවා ලබාගත හැකිය. ටෙන්ඩර්පත් භාරගැනීම 2022.06.15 දින ප.ව 2.30ට අවසන් වන අතර ඉන් අනතුරුව එම ටෙන්ඩර්පත් විවෘත කරනු ඇත.

**අධ්‍යක්ෂ, කාර්ය මණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුව**
**(4 වන කුළුන, 11 වන මහළ)**
**ශ්‍රී ලංකා මහ බැංකුව**
**අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01 දුරකථන: 0112477482**